දරුවන් උදෙසා
බයිබලයක්

# දානියෙල් - අල්වාගෙන ගිය තරුණයා



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Jonathan Hay
Alastair Paterson

සකස්කරන්නා: Mary-Anne S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

දානියෙල් සහ ඔහුගේ මිතුරන් තිදෙනා ඊශ්‍රායලයේ ජීවත් වූවෝය. දිනක් ශ්‍රේෂ්ඨ රජෙක් ඔවුන්ගේ මව්බිමට පැමිණ සියලු දක්ෂ තරුණයන් තම රටට රැගෙන ගියේය. ඒ රජුට තිබුනේ දිගු නමකි - නෙබුකද්නෙශර් . ඔහු ජීවත් වූයේ බබිලෝනිය නම් ඈත රටකය.



බබිලෝනියේදී තරුණයන්ට ඉතා හොඳ සැළකිලි ලැබුණි. රජතුමා ලෝකයේ සෑම රටකින්ම තෝරාගෙන තිබුනේ දීප්තිමත්ම සහ හොඳම තරුණයන්ය. බබිලෝනියේ භාෂාවෙන් ඔවුන්ව පුහුණු කිරීමට ඔහු සැලසුම් කළේය. ඒ, ඔවුන්ට ඔහුගේ සේවකයන් බවට පත් වී රාජ්‍යය පවත්වාගෙන යාමට ඔහුට උපකාර කළ හැකි බැවිණි.



ආහාරද ඉහළ තත්වයේ තිබුණි. තරුණයෝ රජු කන දේම අනුභව කළෝය. නමුත් දානියෙල් සහ ඔහුගේ මිතුරෝ එම ආහාර බොරු දෙවිවරුන්ට කැප කර තිබූ නිසා ඒවා අනුභව කිරීමට කැමති නොවූවෝය. දානියෙල් තම දෙවියන් වහන්සේට විරුද්ධව කිසිදාක කිසිවක් නොකරන බවට පොරොන්දු වී තිබුණේය. ඊශ්‍රායෙල්හි දෙවියන් වහන්සේ විසින් තම සෙනඟට, පිළිම හෝ බොරු දෙවිවරුන් සමඟ කිසිම සම්බන්ධයක් ඇතිකර නොගන්නා ලෙස අණ කර තිබුණි.



දානියෙල් තම පුහුණුව භාර පුද්ගලයාගෙන් රජුගේ කෑම නොකා සිටීමට අවසර ඉල්ලා සිටියේය. රජතුමා දැන ගතහොත් බෙහෙවින් කෝප වනු ඇත. නමුත් දෙවියන් වහන්සේ විසින් දානියෙල්ව මේ මිනිසාගේ ප්‍රියතමයා බවට පත් කර තිබුණි.



ඔහු දානියෙල්ට සහ ඔහුගේ මිතුරන් සමඟ පරීක්ෂණයක් කිරීමට එකඟ වූයේය. දින දහයක් ඔවුහු එළවළු පමණක් අනුභව කර ජලය පමණක් පානය කළෝය. දින දහයක් අවසානයේදී දානියෙල් සහ ඔහුගේ මිතුරන් රජුගේ ආහාර අනුභව කළ අනෙක් සියලුම තරුණයින්ට වඩා නිරෝගීව සිටියෝය. එබැවින් ඔවුන්ට දිගටම එළවළු සහ ජලය පමණක් කෑමට බීමට අවසර ලැබුණි.



මේ තරුණයෝ දෙවියන් වහන්සේට ගෞරව කළෝය. දෙවියන් වහන්සේද ඔවුන්ට ගෞරව කළ සේක. ඔවුන් ඉගෙන ගත් දේ තුළින් දෙවියන් වහන්සේ ඔවුන්ට දැනුම සහ කුසලතා ලබා දුන් සේක. සියලු දර්ශන සහ සිහින තේරුම් ගැනීමට දානියෙල්ට ප්‍රඥාව තිබුණි.





බබිලෝනියේ වසර තුනක ඉගෙන
ගැනීමේ කාලයෙන් පසු, සියලුම
තරුණයන් නෙබුකද්නෙශර් රජු වෙත
ඉදිරිපත් කරන ලදී. ඔහු දානියෙල් සහ
ඔහුගේ මිතුරන් තිදෙනා ඔවුන්
අතරින් හොඳම අය ලෙස තෝරා
ගත්තේය. ඇත්තෙන්ම, දානියෙල් සතු
ප්‍රඥාව ඔහුගේ රාජ්‍යයේ සිටි සියලුම
ප්‍රඥාවන්තයන්ට වඩා වැඩි බව රජු
තේරුම් ගත්තේය.

එක් රාත්‍රියක රජු නරක සිහිනයක් දුටුවේය. ඔහු තම විජ්ජා කරුවන්, ශාස්ත්‍රඥයන් සහ මන්තර ගුරුකම් කරන්නන්ට තමන් ඉදිරියේ පෙනී සිටින ලෙස ඉල්ලා සිටියේය. “මම සිහිනයක් දුටුවෙමි, ඒ සිහිනය තේරුම් ගැනීමට මාගේ ආත්මය කැළඹේයැ”යි රජු පැවසීය.

ප්‍රඥාවන්තයෝ පිළිතුරු දෙමින්, “රජතුමා සදාකල් ජීවත් වේවා! ඔබගේ සේවකයන්ට සිහිනය කියන්න, එහි තේරුම අපි ඔබට කියන්නෙමු”යි කීවෝය.



රජු පිළිතුරු දෙමින්, "නැත! මා දුටු සිහිනය කුමක්ද සහ එහි තේරුම ඔබ මට පැවසිය යුතුයි. එසේ නොකළහොත් ඔබ කැබලිවලට කපා ඔබේ ගෙවල් ගිනිබත් කරනු ඇත! නමුත් ඔබ මට සිහිනය සහ එහි තේරුම පැවසුවහොත් ඔබට ත්‍යාග සහ මහත් ගෞරවය ලැබෙනු ඇතැ"යි කීවේය. ඇත්ත වශයෙන්ම, ප්‍රඥාවන්ත කිසිවෙකුට රජු දුටු සිහිනය පැවසිය නොහැකි විය.



“ඔබ ඉල්ලන දේ කළ හැකි මිනිසෙක් මිහිපිට නැත, එය කළ හැක්කේ දෙවිවරුන්ට පමණි, ඔවුන් මිහිපිට ජීවත් නොවන්නේ ය”යි රජුගේ නුවණැතියෝ රජුට පැවසූහ. රජතුමා බෙහෙවින් කෝප වී “බබිලෝනියේ සියලු ප්‍රඥාවන්තයන් විනාශ කරන්නයැ”යි අණ කළේය.



හේවායෝ දානියෙල් සොයා ආවෝය. දානියෙල් රජුගේ සෙන්පතියා වූ අරියෝක් අමතා "රජ තෙමේ සියලු නුවණැත්තන් විනාශ කරන්නේ මන්දැ"යි ඇසීය. එවිට අරියෝක් සිදු වූ සියල්ල දානියෙල්ට කීවේය. දානියෙල් රජු හමුවීමට ගියේය. ඔහු සිහිනයේ තේරුම රජුට පැවසීමට කල් ඉල්ලා සිටියේය.



එවිට දානියෙල් තම නිවසට ගොස් ඔහුගේ මිතුරන් වූ ශද්‍රක්, මේෂක් සහ අබේද්නෙගෝ හට සියල්ල කීවේය. දානියෙල් සිහිනය කුමක්ද හෝ එහි තේරුම කුමක්දැයි දැන සිටියේ නැත. නමුත් ඔහු සියල්ල දන්නා කෙනෙකුව දැන සිටියේය. ඒ දෙවියන් වහන්සේය. දානියෙල් සහ ඔහුගේ මිතුරෝ යාච්ඤා කළෝය.



දෙවියන් වහන්සේ දානියෙල්ට සිහිනය සහ එහි අර්ථය පෙන්වා දුන් සේක. දානියෙල් ස්වර්ගයේ දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින්, “දෙවියන් වහන්සේගේ නාමයට සදාකාලයටම ප්‍රශංසා වේවා, මන්ද ප්‍රඥාවත් බලයත් උන්වහන්සේගේයැ”යි කීවේය. දානියෙල් ඉක්මනින් රජු වෙත ගොස්, “රහස් හෙළි කරන දෙවි කෙනෙක් ස්වර්ගයේ සිටින්නේය” කියා කීවේය. ඔහු රජතුමා දුටු සිහිනය සහ සිහිනයේ තේරුම රජුට පැහැදිලි කළේය.



නෙබුකද්නෙශර් රජු සිහිනය සහ එහි තේරුම ඇසූ විට, ඔහු දානියෙල් ඉදිරියෙහි වැටී, “සැබවින්ම ඔබේ දෙවියන් වහන්සේ දෙවිවරුන්ගෙත් දෙවියන් වහන්සේය, රජවරුන්ගේත් ස්වාමියාය, රහස් හෙළි කරන තැනැන්වහන්සේය, ඔබට මේ රහස හෙළි කළ හැකිවූ බැවින් මම එය දනිමි”යි කීවේය. එවිට රජ දානියෙල්ව ශ්‍රේෂ්ඨ මිනිසෙකු බවට පත් කර ඔහුට බොහෝ තෑගි ලබා දුන්නේය. ඔහුව මුළු බබිලෝනියේ ප්‍රාන්තයේ පාලකයා ලෙසද බබිලෝනියේ සියලු ප්‍රඥාවන්තයන් කෙරෙහි ප්‍රධානියා ලෙසද පත් කළේය.



දානියෙල් - අල්වාගෙන ගිය තරුණයා

# දේව වචනයෙන් එක් කථාවක්

# බයිබලයේ

දානියෙල් 1-2

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)